# ගීත අසමු රස විදිමු එක්වී ගීයට නටමු




දුවේ පුතේ ඉහත රූප දෙස බලන විට ඔබට මතක් වන්නේ කුමක්ද? ඔබ පාසල් යන ආකාරය, තමන්ගේ සුරතල් වසු පැටියා එක්ක සෙල්ලම් කරපු ආකාරය සිහියට නැගේවි. ඔබ අසා ඇති මෙවැනි අවස්ථාවක් ගැන ලියවී ඇති ගීතයක් පිළිබදව

"පාන්දරින් ඉස්කෝලෙට ........" මේ ගීතය ඔබ අසා ඇති. හොදයි දුවේ පුතේ මේ ගීතය හොදින් ශ්‍රවණය කර පහත උපදෙස් කියවා අදාල ක්‍රියාකාරකම් කරන්න.

1. ගීතය හොදින් ශ්‍රවණය කරන්න.
2. ගීතයේ අදහසට අනුව ඔබ කැමති අයුරින් නිදහසේ චලන නිර්මාණය කරන්න.
3. එහිදී ගීතයේ අදහසට අනුව මුහුණේ ඉරියව් වෙනස් කිරීම පිළිබඳව සැළකිළිමත් වන්න.

ක්‍රියාකාරකම

1. පාන්දරින් ඉස්කෝලෙට හා මගෙ පොඩි යාලු යන ගීත දෙක හොදින් ශ්‍රවණය කර එම ගීතවලට ඔබ කැමති චලන නිර්මාණය කරන්න.
2. එම ගීත දෙකෙහි පද රචනය, සංගීත නිර්මාණය හා ගායකයා කවුරුදැයි වෙන් වෙන්ව ලියන්න.
3. උදෑසන පරිසරයේ දැකිය හැකි සිදුවීම් කිහිපයක් ලියන්න.
4. මෙම ගීතවලින් අපට ලබා ගත හැකි ආදර්ශ මොනවාද?